# රූපවාහිනියේ විකාශය වන උපසිරැසි යෙදූ ඉංග්‍රීසි චිත්‍රපට තෝරා ගැනීමේදී ළමා පරපුර දක්වන රුචිකත්වය

**A.P.M.A.** තිලකරත්න

**FGS/MACO/MC/10/012**

ප්‍රවේශ අංකය: 1309
වර්ග අංකය:

සමාජීය විද්‍යාපති ජනසන්නිවේදන උපාධියෙහි අවශ්‍යතාවක් පූරණය කරනු පිණිස කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය වෙත ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධයකි

මාර්තු 2015

# සාරාංශය

"රූපවාහිනියේ විකාශය වන උපසිරැසි යෙදූ ඉංග්‍රීසි චිත්‍රපට තෝරා ගැනීමේදී ළමා පරපුර දක්වන රුචිකත්වය කවරාකාරද" යන පර්යේෂණ ගැටලුව පාදක කර ගනිමින් මෙම සන්නිවේදනාත්මක අධ්‍යයනය සිදු කළෙමි.

ළමුන් තුළබටහිර ජීවිතය පිළිබඳ බලාපොරොත්තු සහගත පරමාදර්ශීය ප්‍රතිරූපයන් මැවී තිබේද? ,බටහිර මොඩලයේ චරිත එම චිත්‍රපට මගින් මෙරට නිර්මාණය වන්නේ ද?, මෙරට රූපවාහිනි නාලිකා වලට ළමා පරපුරේ ඇති රුචිකත්වය කවරාකාර ද? යන්න සොයා බැලීම මෙහි අනු අරමුණු විය.

මෙම පර්යේෂණයේ දී ළමුන් ගේ රුචිකත්වය, කාටූන්, ප්‍රේමය, ලිංගිකත්වය, සිප ගැනීම්, නිදහස් ජීවිතය, කොණ්ඩා මෝස්තර, ඇඳුම් විලාසිතා, සුවපහසු ජීවන රටාව, භාණ්ඩ හා උපකරණ බහුලතාව වැනි සාධක මත රඳා පවතින බව නිගමනය විය. නියැදියේ බහුතරය දැකීමට ප්‍රිය කළේ ලිංගික ලෙස ආකර්ෂණීය නළු නිළියන්ය. එමෙන්ම ආවේගශීලීත්වය, ප්‍රචණ්ඩත්වය, ලේ වැගිරීම් වැනි දර්ශන සහිත චිත්‍රපට ද සිසුන්ගේ රුචිකත්වයට හේතු වී ඇත.

මෙරට ළමුන් බටහිර, විශේෂයෙන්ම ඇමරිකානු ජීවිතය පිළිබඳ, පරමාදර්ශීය ප්‍රතිරූපයන් නිර්මාණය කරගෙන ඇති බවද නිගමනය විය. නියැදියේ බහුතරය ඇමරිකාවට සංක්‍රමණය විමට දැඩි රුචිකත්වයක් දක්වා ඇත. ඇමරිකානු ජීවිතයේ සිහින ඔවුන් සතුව පවති. සුන්දර ස්ථාන නැරඹීම, පහසුකම් පිරි ජීවිත, නිදහස් ජීවිතය, විනෝදකාමීත්වය, ලොව පිළිගත් විශ්වවිද්‍යාල වල අධ්‍යාපනය ලැබීම, ජනප්‍රිය ආයතන වල රැකියා කිරීම, ලොව ජනප්‍රිය වෙළඳනාම සහිත මෝටර් රථ මිලදී ගැනීම, නව විලාසිතා සිදු කිරීම, හොඳ පවුල් ජීවිතයක් ගත කිරීම, වැනි සිහින ස්ත්‍රී පුරුෂ, ජාති, සහ භාෂා භේදයකින් තොරව පවතින බව නිගමනය විය.

හිරු රූපවාහිනි නාළිකාවට, මෙරට ළමුන්ගේ බහුතර රුචිකත්වය හිමි වූහ. බටහිර මොඩලයේ චරිත, මෙම චිත්‍රපට මගින්, මෙරට නිර්මාණය නොවන බවද නිගමනය විය.

මෙම පර්යේෂණයෙන් එළඹි නිගමන වලට අනුව ළමුන් රූපවාහිනියට නිරාවරණය වන කාලසීමාව ඉතා ඉහළය. සමාජයේදී හා නිවසේදී ඔවුන්ට එල්ලවනු ලබන මානසික හා ශාරීරික පීඩන ද ඉහළ මට්ටමක පවතී. ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සාපේක්ෂව ළමුන්ට සැළකීම සිදු වන බව දක්නට ලැබේ. නව තාක්ෂණය වැරදි ලෙස භාවිත කරනු ඇතැයි පූර්ව නිගමනයකට එළඹ,ළමුන්ට නව තාක්ෂණය භාවිතයට තහංචි පනවා ඇත. ළමුන්ට විලාසිතා කිරීමට ඇති අවස්ථාව ද අහිමි කර තිබේ. දරුවන්ගේ පාසල් ප්‍රවාහන සේවා වල මෙන්ම අධ්‍යාපන රටාවේද බොහෝ අඩුපාඩු පවතී. පර්යේෂණයෙන් ලද නිගමනයන්ට අනුව මෙම තත්වයන් මගහරවා ගැනීම නොපමාව සිදු කළ යුතුය.

ළමුන්ට කුඩා කල සිටම මවුපියන්ගේ ආදරය, සෙනෙහස හා රැකවරණය ලබා දෙමින් යහපත අයහපත ආදරයෙන් පෙන්වා දෙමින් වඩා බුද්ධිමත්, සංවේදී හා ස්වයං වාරණයක් සහිත දරුවෙකු සමාජයට දායාද කිරීමට උත්සාහ ගතහොත් වඩා යහපත් රටක් අපට දැකිය හැකි වනු ඇත. ඊට සරිලන ලෙස අධ්‍යාපනයේ ව්‍යුහීය සැකැස්ම පරිවර්තනයකට හසුකරන්නට ද කාලය එළඹ ඇත.

පාරිභාෂික පද-චලන චිත්‍ර උපසිරැසි, විකාශය කරනවා, රූපවාහිනි, චිත්‍රපටය, නාළිකාව

# Abstract

I did this mass communicative study under the research problem of," How is the interest indicated by children in selecting English movies with subtitles, telecast by television" Making a clear investigation on following things, is the aim of this study.

" Are there hopeful realities in these children about western life?

Do these movies create western model characters in the country?

How is the interest of children in watching T.V channels of Sri Lanka?

It was able to find out the interest of children depends on cartoons, love, sex, embracing, freedom in life, hair style, style of dressing, comfortable life style and the abundance of goods and equipment.

The majority of the sample preferred to watch sexually attractive actors and actresses. In addition to that, the scene of aggressiveness, quarrelsome habits and violence are capable of enhancing children's violence.

It was able to verify that the children of this country have created a pure reflection on the life of America. The majority of the sample has paid a high desire to migrate of America.

They have dreams to have and America life. It was able to verify that they have desire to visit pleasant places, have comfortable lives, lives with freedom, entertainment, studying in leading universities, employing in reputed companies, purchasing motor vehicles with famous trade names, having modern styles and having a successful family life.

They have these desires without any bar of gender or language.

Hiru T.V. channel was able to attract the interest of the children of Sri Lanka most. It was able to identify that western model characters are not created by these films.

According to the facts obtained by this research, it is clear that the amount of times that children watch T.V. is very high.

The mental and physical pressure they get from the society and home are in a very high level.
It is clear that the children are regarded according to the gender. There is a prior incorrect conclusion that the children are using technology in an incorrect way.
As a result, children have been banned to use technology. The children have lost the opportunity of having styles. There are many shortcomings in the school Transport services, as same as in the education system. According to the findings of the research, it is essential to overcome these circumstances. We can expect a better country by giving love and affection to the children and trying to contribute a wise and sensitive child to the society.
**Keywords-** movies, subtitles, telecast, television,film